# ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය 2006 වර්ෂයේදී රු.මිලියන 2,003 ක් වූ ධන ශේෂයක සිට සමාලෝචිත වර්ෂය අවසානයට රු.48,945.1 ක ඍණ ශේෂයක් දක්වා පහත දැක්වෙන පරිදි අඩුවී තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව , 2010 අගෝස්තු අවසානයට සියළුම අරමුදල් අවසාන වී තිබුණු අතර, ඉන් පසු කෘෂිකාර්මික හා ණය රක්ෂණ මණ්ඩලයේ පවතින වෙනත් අරමුදල් වලින් කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත පැවැත්ම සම්පූර්ණයෙන්ම රජයේ ප්‍රදාන මත රඳා පවතී.

| වර්ෂය | යෝජනා ක්‍රමයේ ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 2006 | 2,003.7 |
| 2007 | 1,639.8 |
| 2008 | 1,404.8 |
| 2009 | 663.8 |
| 2010 | (40,536.7) |
| 2011 | (44,154.2) |
| 2012 | (48,945.1) |

### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 1 ප්‍රකාරව පළමුවරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 39 ප්‍රකාරව ලාභය හෝ පාඩුව මඟින් සාධාරණ අගය, ණය සහ ලැබිය යුතු ශේෂ කල්පිරීම හා විකිණීමට තබා ගැනීම ආදී මූල්‍ය උපකරණ හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 ප්‍රකාරව හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්ම සඳහා ආයුගණක තක්සේරුව හා ඒ සඳහා ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 19 ප්‍රකාරව නියම කරන ලද පතිලාභී සැලැස්ම යටතේ වගකීම නිදහස් කිරීම සඳහා සේවක හා සේවක දෙපාර්ශ්වය විසින් තවදුරටත් සිදුකරන දායකයන් ආයෝජනය කර නොතිබුණි.

(ඉ) විශ්‍රාම වගකීම සඳහා අවසාන ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී සිදුකරන ලද අතර ඉන් පසු විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වගකීම් පිළිබඳ නිරවද්‍යතාවය ප්‍රශ්නගත වේ.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන්ට ගෙවන ලද රු.7,305,897 ක් වූ විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර නොතිබුණි. එබැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයට විශ්‍රාම වැටුප් වගකීම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් ආපසු ගැනීමේදී තැපැල් කාර්යාල වලට ගෙවන ලද රු.6,148,860 ක් වූ කොමිස් මුදල, කොමිස් මුදල් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර දක්වා තිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.4,654,023 ක් වූ ලැබිය යුතු මුළු ශේෂ එකතුවෙන් රු.2,111,885 ක් එනම් සියයට 45 ක් පමණක් අදාල පාර්ශ්වයන් විසින් සනාථ කර තිබුණි.

(ආ) එකතුව රු.2,382,031 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) යෝජනා ක්‍රමය එහි සියළුම මුදල් වැයකර අවසන් වීම හේතුවෙන් , ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් රු.533,014,955 ක හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් රු.260,976,074 ක කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. ඉහත ණය හා ඒ මත පොලී 2013 මැයි 20 වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 1.2.5 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ රු.2,791,679 ක් වටිනාකම වූ චෙක්පත් 48 ක් හා රු.7,152,249 ක් වූ බැංකු අණකර මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් 2 දෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් වංචා කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බව මණ්ඩලය විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) රු.369,590 ක් වූ විශ්‍රාම මුදල් වංචා කරන ලද ක්ෂේත්‍ර නිලධාරියකුට විරුද්ධව ගොනු කර ඇති නඩුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරියා සේවයෙන් පහකර තිබුණි. කෙසේ වුවද ඔහුගෙන් රු.100,000 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණු අතර නඩුව අවසන් කර තිබුණි. එබැවින් රු.269,590 ක ශේෂය අයකර ගත නොහැකි වූ අතර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ලිඛිත සාක්ෂි 2013 මැයි 20 දක්වා ඉදිරිපත් නොවීම හේතුවෙන් ගිණුම්වල වූ පහත දැක්වෙන විෂයය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විස්තරය | මුදල | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන් 936 ක් සඳහා ගෙවන ලද විශ්‍රාම වැටුප් ගෙවීම් | 3,288,000 | විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තරාත්මක උපලේඛන |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.4,670,653,346 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,617,570,557 ක් වුයෙන් රු.1,053,082,789 කින් එනම් සියයට 29 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| | 2012 | 2011 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | ප්‍රතිශතය |
| පොලී ආදායම | 2,702,921 | 1,566,195 | 72.6 |
| ගොවීන්ගේ දායකය | 55,475,042 | 108,458,800 | (48.8) |
| විශ්‍රාම වැටුප් ගෙවීම | (1,380,677,601) | (1,226,744,103) | (12.5) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (52,552,338) | (54,806,188) | 4.1 |
| වියදමට වැඩි ආදායම | (1,375,051,976) | (1,171,525,296) | (17.37) |
| රජයේ ප්‍රදාන | 8,232,560 | 664,855,487 | (98.8) |
| විශ්‍රාම වැටුප් බැරකම වැඩිවීම | 3,216,991,000 | (3,059,459,000) | 5.1 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | 1,320,949 | 1,227,701 | 7.6 |
| පරිපාලනය සඳහා ආදායම | 66,292,332 | 68,159,142 | (2.7) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (154,456,210) | (120,828,592) | (27.8) |
| වර්ෂය සඳහා සමස්ත ඌනතාවය | (4,670,653,346) | (3,617,570,557) | 29.11 |

ඉහත ප්‍රතිඵලය සඳහා පහත දැක්වෙන කරුණු හේතුවී තිබුණි.

(අ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පොලී ආදායම සියයට 72.6 කින් වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ගොවීන්ගේ දායකය සියයට 48.8 කින් අඩුවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව 2007 වර්ෂයේදී සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ශේෂ පත්‍ර දිනයට ගොවීන්ගේ විශ්‍රාම වැටුප් වගකීම තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම රු.3,216,991,000 ක් ලෙස දක්වා තිබුණු අතර අනුරූපී සංඛ්‍යා නැවත දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රු.මිලියන 8.23 ක් වූ රජයේ ප්‍රදානය ලැබී තිබුණි. ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා සමග සැසඳීමේදී එය සියයට 98.8 කින් අඩුවී තිබුණි.

## 2.2 මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිපාලන වියදම් වලින් කොටසක් රජයේ ප්‍රදාන වලින් දරා තිබුණද , යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් අවදානම් තත්ත්වයක විය. යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය පහත දැක්වෙන පරිදි 2008 වර්ෂයෙ රු.මිලියන 235 ක ඌනතාවය 2012 වර්ෂයේදී රු.මිලියන 4,671 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවැත්ම පිළිබඳ බරපතල අවිනිශ්චිතතාවයක් පවතී.

ඉකුත් වර්ෂ පහක මූල්‍ය ප්‍රතිඵල අනුව ශුද්ධ ඌනතාවය පහත පරිදි වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) |
| මුළු ආදායම | 61,148 | 115,434 | 170,898 | 306,607 | 431,209 |
| මුළු වියදම | (1,587,686) | (1,402,349) | (1,195,110) | (1,103,779) | (951,623) |
| විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | (3,059,459) | (2,938,033) | - | - | - |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | (4,743,529) | (4,346,404) | (3,962,245) | (797,172) | (520,414) |
| රජයේ ප්‍රදාන | 71,555 | 727,605 | 39,500 | 55,860 | 285,000 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය | 1,321 | 1,228 | 1,477 | - | - |
| රජයේ ප්‍රදාන වලින් පසු ශුද්ධ අතිරික්තය / ( ඌනතාවය ) | (4,670,653) | (3,617,571) | (3,921,268) | (741,312) | (235,414) |

i. 2008 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ බදවා ගැනීම් සඳහා උනන්දු නොකිරීම හේතුවෙන් ආදායම සියයට 85 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබූ ගොවීන්ගේ ප්‍රමාණය වැඩිවීම හා යෝජනා ක්‍රමයෙන් ආපසු ගැනීම් වැඩිවීම හේතුවෙන් එම කාල පරිච්ඡේදය තුළ එම මුළු වියදම සියයට 67 කින් වැඩිවී තිබුණි.

ii. නියම කොන්දේසි වලට විශ්‍රාම වැටුප් බැරකම තහවුරු කිරීම හේතුවෙන් හා වියදම වැඩිවීම හේතුවෙන් 2008 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී රජයේ ප්‍රදානයට පෙර ශුද්ධ අතිරික්තය සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තුළදී යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගෙන් එකතු කර ගන්නා ලද මුළු දායකයන් හා විශ්‍රාම වැටුප් ගෙවීම් පහත දැක්වේ.

| වර්ෂය | දායකය | විශ්‍රාම වැටුප් ගෙවීම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2008 | 163.1 | 809.1 |
| 2009 | 148.7 | 955.6 |
| 2010 | 136.7 | 1,044.7 |
| 2011 | 97.6 | 1,226.7 |
| 2012 | 49.6 | 1,380.7 |

(ඇ) පහත දැක්වෙන පරිදි 2007 වර්ෂයේ සිට ආයෝජන සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේදී ආයෝජන වලින් ලද ආදායමද සීඝ්‍ර අඩුවීමක් වාර්තා කර තිබුණි.

| වර්ෂය | වර්ෂය අවසානයට ආයෝජන | වර්ෂය සඳහා පොලී ආදායම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2007 | 1,656.0 | 251.3 |
| 2008 | 1,256.1 | 243.9 |
| 2009 | 582.2 | 138.9 |
| 2010 | 3.5 | 14.9 |
| 2011 | 30.7 | 1.6 |
| 2012 | 12.4 | 2.7 |

ඉහත තොරතුරු වලට අනුව , ආයෝජන 2007 වර්ෂයේ රු.මිලියන 1,656 සිට 2012 වර්ෂයේ රු.මිලියන 12.4 දක්වා එනම් සියයට 99 ක් දක්වා අඩුවී තිබුණු අතර පොලී ආදායම 2007 වර්ෂයේ රු.මිලියන 251.3 සිට 2012 වර්ෂයේ රු.මිලියන 2.7 දක්වා එනම් සියයට 98.92 ක් දක්වා අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී යෝජනා ක්‍රමයේ අරමුදල් භාරදී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස යෝජනා ක්‍රමයේ මූල්‍ය හිඟයන් වැඩිවීම හේතුවෙන් බඳවා ගැනීම් නවතා තිබුණි. යෝජනා ක්‍රමයේ මෙහෙයුම් පිළිබඳ අවසාන තීරණයක් ගෙන නොතිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු.58,428,092 ක් වූ දෙවැනි හා පසු වාරික රැස්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී එක් ගොවියෙකු හෝ බඳවා ගැනීම් කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ සිට උපලබ්ධි නොවී පැවතුණු බැංකු ගිණුම් තුනක තැන්පත් කරන ලද චෙක්පත් 116 කට අදාළව රු.1,179,624 ක්වූ උපලබ්ධි නොවූ තැන්පතු වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| ගිණුම් අංකය | තැන්පත් කරන ලද කාල පරිච්ඡේදය | චෙක්පත් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| 100-150-112345 | 1992- 2000 | 81 | 1,112,339 |

| | | | |
|---|---|---|---|
| 100-150-112347 | 1993-2012 | 07 | 40,650 |
| 100-150-112344 | 1993-1998 | 28 | 26,635 |
| | | ---- | ------------ |
| | | 116 | 1,179,624 |

## 3.3 ව්‍යාපෘති ප්‍රමාදයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ දායකයන්ගේ පෞද්ගලික ගිණුම් පරිගණක ගත කිරීම සඳහා 1987 වර්ෂයේ සිට රු.මිලියන 21.5 ක මුදලක් ගෙවා තිබුණද , වර්ෂ 25 ක් ගත වීමෙන් පසුව , 2012 දෙසැම්බර් 31 වන විටත් ගිණුම් පරිගණක ගත කිරීම සම්පූර්ණ කර හෝ යාවත්කාලීන කර නොතිබුණි. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සඳහා දායකයින් සුදුසු බවට පත්වීම තීරණය කිරීමට ප්‍රමාණවත් තොරතුරු යෝජනා ක්‍රමය සතු නොවීය. දායකයන්ගේ ගිණුම් දිස්ත්‍රික් කාර්යාල මඟින්ද යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා නව පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීමට 2008 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ මත දරන ලද වියදම රු.5,479,120 ක් විය. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මාස 6 ක් ඇතුළත නිම කළ යුතු වුවද එය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පරිගණකගත පද්ධතිය

(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම හා නොගෙවන ලද විශ්‍රාම වැටුප්